ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් **1**හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයේදී වෙළඳපොල වටිනාකමේ එකතුව රු.6,400,000 ක්වූ ඩබල් කැබ් රථය සහ ත්‍රිරෝද රථයක් ගිණුම්වලට ඇතුළත් නොවීම හේතුවෙන්, මුළු වත්කම් එම වටිනාකමින් අඩුවෙන් වාර්තා වී තිබුණි.	රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය සමඟ සාකච්ඡා කර නිල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව 2025 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී එම ස්ථාවර වත්කම් ඇතුලත් කරන බව	අදාළ වත්කම් නිසි පරිදි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් එකතුව හෙක්ටයාර් 13.183 ක්වූ ඉඩම් හා එකතුව වර්ග මීටර් 8,256 ක්වූ ගොඩනැගිලි 05 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 කට අදාල ඉඩම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 කට අදාල ගොඩනැගිලි මේ වන තෙක් තක්සේරු කර නොමැති බවත් 2025 වර්ෂයේදී මෙම දේපළ වලින් කොටසක් හෝ තක්සේරු කර අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව	කඩිනම් වැඩපිළිවෙලක් යොදා මෙම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කළ යුතුය.
(ඇ)	මාතර, වැලිගම හා කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවලට අදාළව රජයේ ඉඩම් පිළිබඳ ලේඛනය සකස් කර නොතිබුණි. මේ නිසා 1947 අංක 08 දරන ආඥා පනතේ නියෝග 180 අනුව කාර්යයන් ඉටුකිරීම සහ ඉඩම්වල සුදුසු කළමනාකරණය සිදු කිරීම අපහසු වී තිබුණි.	රජයේ ඉඩම් වසම් අනුව හඳුනාගෙන ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමින්, අනවසර අල්ලා ගැනීම්වලට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලබා ඇති අතර, වාරි, වෙරළ, මාර්ග හා වන රක්ෂිත වැනි ආයතන සතු ඉඩම්වල අනවසර පරිහරණය පිළිබඳව සම්බන්ධ ආයතන දැනුවත් කිරීමටද කටයුතු කරමින් ඇත.	අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවලට අදාළ ඉඩම් ලේඛනය සකස් කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු අතර, එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයයන් 19 කට අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.5 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර මූලධන වැය විෂයය 05කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ක සිට සියයට 72 ක පරාසයක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී තිබුණි.	විගණන නිරීක්ෂණය පිළිගෙන ඇති බව	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු අතර, එහි ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර, දුර්වල කාර්යසාධනය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	වැය විෂයයන් 08 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 12 කින් සියයට 2 සිට 113 දක්වා පරාසයකින් ප්‍රතිපාදන මාරුකර වියදම් දරා තිබුණු අතර තවත් වැය විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එහි ප්‍රතිපාදනයන්ගෙන් සියයට 01 සිට සියයට 12 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමට කටයුතු කර තිබුණි.	විගණන නිරීක්ෂණය පිළිගෙන ඇති බව	- එම -
(ඇ)	1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 "අ" අතුරු විධානය යටතේ විවිධ ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඉඩම් අත්කර ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් එකතුව රු.760,857,627 ක්වූ පොලී මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. තවද අදාළ ඉඩම් අත්කර ගැනීමේ අරමුණු වෙනුවෙන් භාවිතා කර නොතිබුණු බැවින් අදාළ වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත්වී තිබුණි.	ආයතනයන්හි අරමුණු වෙනස්වීම හේතුවෙන් ඉඩම් අත්පත් කිරීමේ මුල් අරමුණ ඉටුකර ගැනීම අපහසු වී ඇති බව පිළිගනු ලැබේ.	විධිමත් පරීක්ෂණයක් පවත්වා ප්‍රමාදය සඳහා වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් අදාළ පරිදි කටයුතු කිරීමටත්, වන්දි පරීක්ෂණ කඩිනම් කර ව්‍යවස්ථාපිත වන්දි කඩිනමින් නිදහස් කිරීමටත්, මේ වනවිට අත්කරගත් ඉඩම් අදාළ අත්කරගත් අරමුණට යෙදවීමටත් කටයුතු කළ යුතුය.

3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 14කින්, දෙපාර්තමේන්තු 11 කින් හා අනෙකුත් ආයතන 02 කින් ලැබී තිබුණු එකතුව රු.111,181,222 ක්වූ ප්‍රතිපාදනවලින් එකතුව රු. 81,779,610 ක් පමණක් වියදම් කර තිබුණු බැවින් එකතුව රු.29,401,612 ක් හෙවත් මුළු ලැබුණු ප්‍රතිපාදනවලින් සියයට 26ක් උපයෝජනය කර නොතිබුණි.	සමහර ප්‍රතිපාදන අවලංගුවීම තුල පවරා නොගැනීමත්, සමහර ප්‍රතිපාදන වර්ෂය අවසානයට ආසන්නව ලබාදීම හේතුකොටගෙන වියදම් දැරීමට හා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම, චක්‍රලේඛ සහ අනුමැතියන් ලබා ගැනීමේ කල්පමාවන් යනාදිය මේ සඳහා හේතු වූ බව	ප්‍රතිපාදන අරමුණුගත කාර්යයන්ට උපරිම වශයෙන් භාවිතා කිරීමට හැකිවන පරිදි අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හෝ ආයතන අතර සම්බන්ධීකරණයක් ඇතිකර විධිමත් වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.
(ආ)	ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීමේ අරමුණු හා පරමාර්ථ පෙරදැරිව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශය මගින් ක්‍රියාත්මක කර තිබුණු ගෘහාශ්‍රිත එළුවන් ඇතිකිරීමේ වැඩසටහන සඳහා රු.4,410,150 ක් වැකර කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 16 ක් තුළ ප්‍රතිලාභීන් 64 දෙනෙකුට එළුවන් 192 ක් බෙදාදී තිබුණි. විවිධ හේතුවල බලපෑම් නිසා ව්‍යාපෘතියේ අරමුණු හා පරමාර්ථ සඵලදායීව ළඟා කර ගැනීමට නොහැකි වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.	ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙවන් ප්‍රායෝගික තත්වයන් ඇති වන බව	මේ සම්බන්ධයෙන් විධිමත් හා සුදුසු පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයන් හරහා දරා ඇති වියදමට අගය එකතුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.
(ඇ)	පරිසර අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ හරිත ව්‍යවසායකයින් ප්‍රවර්ධනය මගින් පරිසර සංරක්ෂණ වැඩසටහන් යටතේ ප්‍රදේශයේ අවශ්‍යතාවයට ගැලපෙන පැළ හා ආහාර භෝග, ඌන භාවිත පළතුරු පැළ, බද්ධ පළතුරු පැළ හා වන ආවරණය වැඩිකළ හැකි ගස් තවාන් දැමීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 14 ක ප්‍රතිලාභීන් 21 දෙනෙකුට රු.6,075,000 ක් ගෙවා තිබුණි. ප්‍රතිලාභීන් විසින් වසර 03ක් ඇතුළත පැළ 345,000 ක් නිෂ්පාදනය කර	2021/2022 වර්ෂවල ආර්ථික අර්බුදය සහ කොරෝනා වසංගතය හේතුවෙන් එකඟ වූ පරිදි ප්‍රතිලාභීන්ට කටයුතු කිරීමට නොහැකිවීම සහ 2023/2024 වර්ෂවල පැවති අධික වර්ෂාවෙන් පැල විනාශ වීම ඊට බලපා ඇත.	විධිමත් පසුවිපරම් ක්‍රියාවලියක් හඳුන්වා දීම හරහා ව්‍යාපෘතියෙන් ප්‍රගතියක් අත්කර ගැනීමට කටයුතු කළ යුතුය.

	පරිසරයට මුදාහැරීම අරමුණ වී තිබුණු නමුත්, නිෂ්පාදනය කර තිබුණු පැළ ප්‍රමාණය 176,969 ක් හෙවත් අපේක්ෂා කළ පැළ ප්‍රමාණයෙන් සියයට 51 ක් වූයෙන් ව්‍යාපෘතියේ අරමුණු සඵලදායීව ළගාකර ගැනීමට නොහැකි වී තිබුණි.		
(ඇ)	මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2024 අප්‍රේල් 04 දිනැති හා අංක DFD/2004-1 දරන චක්‍රලේඛය ප්‍රකාරව අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් ලබාදීම වෙනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විසින් අදියර 2 ක් යටතේ සහල් කිලෝග්‍රෑම් 2,579,400 ක් මිලදී ගෙන තිබුණි. සහල් කිලෝග්‍රෑමයක් සඳහා එවකට වෙළඳපොලේ පැවති රු.150 ත් 165 අතර වූ සිල්ලර මිල ගණන් නොසලකා සහල් කිලෝග්‍රෑම් 01 ක් රු.186 ක්වූ මිලට මිලදී ගැනීම හේතුවෙන් රු.54,540,680 ක්වූ මූල්‍ය පාඩුවක් රජයට සිදුකර තිබුණි.	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පවත්වන ලද මාර්ගගත සාකච්ඡාවේදී ගත් තීරණ අනුව හා සහතික මිල යටතේ සහල් මිලදී ගැනීම සිදු කළ බව සඳහන් කර ඇත.	විධිමත් පරීක්ෂණයක් පවත්වා මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පිරිමැසුම්භාවයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් රජයට සිදු වී ඇති පාඩුව නිශ්චය කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	වේවැල්, පිත්තල, මැටි, ලීබඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වැලිගම හා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තෝරා ගත් ප්‍රතිලාභීන් 78 ක් සඳහා එකතුව රු.1,527,080 කි වැය කර තිබුණද, ඉන් ප්‍රතිලාභීන් 25 ක් සක්‍රිය ව්‍යවසායකයින් ලෙස කටයුතු කර නොතිබුණු බැවින් ව්‍යාපෘතියේ අරමුණු හා පරමාර්ථ සඵලදායීව ළගාකර ගැනීමට නොහැකි වී තිබුණි.	මෙම උපකරණ ලබා දුන්නේ සුදුසුම පුද්ගලයන්ට බවත්, තෝරාගත් ව්‍යාසායකයින් පිළිබඳව විද්‍යා හා තාක්ෂණ නිලධාරී හා වසම්භාර ආර්ථික සංවර්ධන නිලධාරී නිරන්තර අධීක්ෂණය සිදුකරන බව හා එම නිලධාරීන්ගෙන් මාසික ප්‍රගතිය විමසමින් නිරන්තර අධීක්ෂණයක් කිරීමට ප්‍රාදේශීය ලේකම් සැලසුම් කර ඇති බව.	මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය වැඩි කර ගැනීම සඳහා විධිමත් පසුවිපරම් ක්‍රියාවලියක් ක්‍රියාවට නැංවීමත්, ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති මනා සැලැස්මකින් ආරම්භ කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක කිරීමත් කළ යුතුය.

(ඊ)	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 02 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් වැඩසටහනේ මාතර, අකුරැස්ස හා වැලිගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභින් 62 ක් සඳහා රජයේ දායකත්වය රු.2,001,310 ක් වැයකර ලබාදුන් උපකරණ අරමුණුගත කාර්යයන්ට භාවිතා නොකර දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව තිබීමට හා අබලන්වීමට ඉඩහැර තිබුණ බව නිරීක්ෂණය විය.	මෙම උපකරණ භාවිතය සඳහා සැලසුම් සකස්කර ඇති බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා ප්‍රතිලාභීන් තෝරා ගැනීම හා පසු විපරම් කටයුතු සිදු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීමටත්, මෙවැනි තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම, අධීක්ෂණය හා පසු විපරම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සැකසීමටත් කටයතු කළ යුතුය.
(උ)	“දශවිධ කඳුකර දශකය 2024 – 2033” විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ ජනාධිපති ලේකම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ක්ෂේත්‍රයන් 05 ට ඇතුළත් නොවූ වැඩසටහනක් වෙනුවෙන් එනම් පෙර පාසල් 18 ක් සඳහා අඟල් 43 Smart TV මිලදී ගැනීමට එකතුව රු.1,852,020 ක් වැයකර තිබුණු අතර, ඒ තුළින් ව්‍යාපෘතියේ අරමුණු වූ බහුමාන දරිද්‍රතා දර්ශකයේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.	මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් පෙන්වාදීමෙන් අනුව, ස්මාර්ට් රූපවාහිනි හා අන්තර්ජාල පහසුකම් භාවිතයෙන් නවීන හා සාර්ථක ඉගැන්වීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ හැකි බවට අවධාරණය කර ඇත. එබැවින්, එම උපකරණ භාවිතයෙන් ලැබෙන ප්‍රතිඵලයන් පිළිබඳ පසුවිපරම් ක්‍රියාවලියක් සහ එය විධිමත් ලෙස ඉගැන්වීමේ ක්‍රමවේදයකට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස හා අදාළ අංශ වෙත උපදෙස් ලබාදීමක් සිදුකර තිබේ.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අරමුණට පරිබාහිර ක්ෂේත්‍ර වෙනුවෙන් වියදම් දරා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට වැඩපිළිවෙලක් හඳුන්වා දීමත් කළ යුතුය.
(ඌ)	පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශය මගින් ණය නිකුත් කිරීමට අනුමැතිය ලබා දී නොතිබුණු හරිතාගාර ඉදිකිරීම් ණය යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රතිලාභීන් 05 කට හරිතාගාර ඉදිකර ලබාදීම වෙනුවෙන් සැපයුම්කරුවෙකුට එකතුව රු.5,000,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, අදාළ ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමට ප්‍රමාණවත් වූ සාක්ෂි කිසිවක් නොමැතිව සැපයුම්කරුට ණය මුදල් නිදහස් කර තිබුණු අතර,	ව්‍යාපෘති වාර්තාවක් සකසා පුහුණුවක් ද ලබා දී ප්‍රතිලාභින් 05 දෙනෙකුට ස්වයං රැකියා ණය ක්‍රම යටතේ හරිතාගාර ඉදි කිරීමට ණය, ලක්ෂ 10 බැගින් ලබා දී ඇත. එම ණය මුදල නිකුත් කිරීමේදි අදාල ප්‍රතිලාභින්ගෙන් වවුචර් පත් අත්සන් කරගෙන අදාළ ආයතනය වෙත ලබා දී ඇත. සමෘද්ධි බැංකුවේ ණය නිකුත් කිරීමේදි තාක්ෂණික කමිටුවක් වෙත යොමු නොකරන අතර	නීති රීති හා උපදෙස්වලට අනුකූල කාර්යයන්ට පරිබාහිරව ණය යෝජනා ක්‍රියාත්මක කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ණය ආපසු අයකර ගැනීමට වැඩපිළිවෙලක් යෙදීමත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීමත් කළ යුතුය.

ප්‍රතිලාභීන්ගේ අරමුණු ඉටු වී නොතිබුණු බැවින් ණය වාරික ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් එකතුව රු.4,184,500 ක් වූ හිග ණය ශේෂයක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.	සමෘද්ධි බැංකු කළමනාකරු අධීක්ෂණය යටතේ නිකුත් කරන බව.	

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට හෝ වාර්තා නොවීය.	2025 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී විගණනය විසින් පෙන්වා දී ඇති පවතින පද්ධති සමාලෝචනයක් සිදු කර එහි වාර්තාවන් සමඟ ඉදිරිපත් කරන බව	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර විගණකාධිපති වෙත වාර්තා කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.
(ආ)	විගණකාධිපතිවරයාට අවශ්‍යවන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	හැකි සෑම අවස්ථාවකදීම ඉදිරියේදී 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 ඡේදය ප්‍රකාරව නියමිත පරිදි පිළිතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගන්නා බව	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට ගණන් දීමේ නිලධාරී පෞද්ගලිකව වගවිය යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**අනුකූල නොවීම**		
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය	වගන්තිය ප්‍රකාරව 2022 හා 2023 වර්ෂ සඳහා නිකුත් කරනු ලැබූ වාර්ෂික විස්තරාත්මක කළමණාකරන විගණන වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව විගණකාධිපතිවරයා වෙත වාර්තා කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී මේ සම්බන්ධව අවධානය යොමු කර අවශ්‍ය ප්‍රතිකර්ම ලබා දෙන බව	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර විගණකාධිපතිවරයා වෙත කඩිනමින් වාර්තා කළ යුතුය.
(ආ)	1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය නැවත ලබා ගැනීමේ පනත	මාතර හා කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල එකතුව පර්චස් 74.98 ක්වූ ඉඩම් ප්‍රමාණයක් අනවසරයෙන් රබර් වගා කර බුක්ති විදින නමුත් ඒවා සන්තකය ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මැණුම් ඉල්ලීම් යොමු කර ඇති අතර පසුව අවශ්‍ය කටයුතු සිදු කරන බව	අදාළ මැනුම් කටයුතු හා ඉදිරි කටයුතු කඩිනමින් සිදු කර අනවසර ඉඩම්වල සන්තකය ආපසු ලබා ගත යුතුය.
(ඇ)	2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත	වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කන්දපාමුලවත්ත සුනාමි නිවාස සංකීර්ණය මහල් 04 කින් සමන්විතව බද්ධ නිවාස ආකාරයට ඉදිකර 2007 වර්ෂයේදී නිවාසලාභීන් වෙත භාරදී තිබූ නිවාස ඒකක 28 කින් සමන්විත සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘතිය ලියාපදිංචි කිරීමේ කටයුතු හා දීමනා පත්‍ර නිකුත් කිරීමේ කටයුතු 2023 අගෝස්තු 14 දිනෙන් අවසන් විය යුතු විය. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය සහාධිපත්‍ය දේපලක් ලෙස ලියාපදිංචි කර නිවාසලාභීන් වෙත විධිමත් ඔප්පු සකස් කර ලබාදී නොතිබුණි.	මෙම ගොඩනැගිලි සාහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත පැවරීමට හා නිවාසලාභීන් වෙත දීමනා පත්‍ර ලබා දීමට නොහැකි වී ඇති බව	සහාධිපත්‍ය දේපලක් ලෙස ලියාපදිංචි කර නිවාසලාභීන් වෙත විධිමත් ඔප්පු සකස් කර කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන චක්‍රලේඛය	අකුරැස්ස, කඹුරුපිටිය, කොටපොල,මාතර, මුලටියන, පස්ගොඩ, තිහගොඩ හා වැලිගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක නිලධාරීන් 646 දෙනෙකු අවුරුදු 05 ක කාලසීමාව ඉක්මවා අවුරුදු 01 ත් 25 ත් අතර කාලයක් ස්ථාන මාරුවීමෙන් තොරව එකම සේවා ස්ථානයේ රැඳී සිටින බව නිරීක්ෂණය විය.	ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් අභ්‍යන්තරව සකස්කර වසර 05 ට වැඩි නිලධාරීන් කොට්ඨාශය තුළ සහ කොට්ඨාශයෙන් පිටත ස්ථාන මාරු කිරීම සිදුකිරීමට කටයුතු කරමි.	ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් වහාම සකස් කර චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කළ යුතුය.
(ii)	2018 ජනවාරි 24 දිනැති 05/2018(1) චක්‍රලේඛය	පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය පිළියෙල කිරිම හා ක්‍රියාවට නැංවීමේ කටයුතු අධික්ෂණය හා ඇගයීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රමවේදයන් සකස් කර නොතිබුණි.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය වර්තමානය වනවිට පිළියෙල කර අවසන් කර ඇති බව හා එම කටයුතු අධීක්ෂණය හා ඇගයීම් සඳහා ඉදිරියේදී ක්‍රමවේදයක් සකස්කර ක්‍රියවට නංවනු ලබන බව	සේවාලාභීන්ට උපරිම කාර්යක්ෂම සේවාවක් සැලසෙන පරිදි ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන බවට දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්වරු පෞද්ගලිකව අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය.
(iii)	අංක එච්ඒ/ඩීඒ27/12 දරන හා 2006.03.21, 2009.06.12 දිනැති ලිපි හා අංක HAF-01/14/ පො.සේ.නි/ 26 දරන හා 2012 ඔක්තෝබර් 05 දිනැති චක්‍රලේඛය	ප්‍රාදේශීය ලේකම්වරු සිය කොට්ඨාශයේ නිල නිවාසය තුළ පදිංචිවීම අනිවාර්ය කර තිබුණද වැලිගම ප්‍රාදේශීය ලේකම්, නිල නිවාසයේ පදිංචිව සිට නොතිබුණි. ඒ අනුව 2007 වර්ෂයේ රු.3,922,000 ක් වැයකර ඉදිකර තිබුණු ප්‍රාදේශීය ලේකම්ගේ උපලේඛනගත නිවාසය හා එහි පැවති රු.129,000 ක් වටිනා ස්ථාවර වත්කම් 2021 ජුනි 30 දින සිට විගණිත දින දක්වා වසර 03 යි මාස 06 ක කාලයක සිට නිශ්කාර්යව තිබුණි.	නිල නිවස පදිංචිය සඳහා භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින බැවින් කිසිදු නිලධාරියෙකු එම නිල නිවාසයේ පදිංචි වීමට කැමැත්තක් නොමැති බව හා වර්තමානය වන විට එම අලුත්වැඩියාවන් සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කර ඇති බව	අදාළ අලුත්වැඩියාවන් කඩිනමින් සිදුකර ප්රාදේශීය ලේකම්හට පදිංචිය සඳහා නිල නිවාසය භාරදිය යුතුය.

(iv)	එම	පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ප්‍රාදේශීය ලේකම්ට වෙන්කල උපලේඛනගත නිවාසය හා උපලේඛණගත නොවන රජයේ නිවාස 4 න් 2 ක් නිශ්කාර්යව පැවතුණි.	ස්ථිර ප්‍රාදේශිය ලේකම්වරයෙකු නොමැතිව කටයුතු කල නිසා උපලේඛණගත නිවාසය භාවිතා නොකර තිබුණි. උපලේඛණගත නොවන නිවාස ඉතා පරණ තත්වයේ බැවින් හා සනීපාරක්ෂක පහසුකම් අලුත්වැඩියා කලයුතු මට්ටමේ බැවින් නිවාස නිෂ්කාර්ය වීම අපගේ පාලනයෙන් බැහැර වුවක් බව	අදාළ නිවාස විධිමත්ව හා චක්‍රලේඛයට අනුකූලව උපයෝජනය සඳහා යොදාගත යුතුය.
(ඉ)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ ----------------------			
(i)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 03 ඡේදය	2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට එම වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර අනුමැතිය ලබාගත යුතු වුවත්, එදින සිට දින 37 ක් ප්‍රමාද වී පිළියෙල කර රාජ්‍ය පරිපාලන, ස්වාදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමුකර තිබූ නමුත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.	ඉදිරියේදී එම තත්ත්වය නිවැරදි කිරීමට සැලසුම් අංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් සිට කරන බව කාරුණිකව දන්වමි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර එය නියමිත දිනට පෙර අනුමත කර ක්‍රියාත්මක කිරීමට හා ප්‍රගති සමාලෝචනය කිරීමට ගණන් දීමේ නිලධාරී කටයුතු කළ යුතුය.
(ii)	04 ඡේදය	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලබන්නේ විසර්ජන කෙටුම්පත අනුමතවීමෙන් පසුව නිසා මෙම කල්පමාව සිදුවී ඇති බව හා ඊට අදාල අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යොමුකලද ඊට අදාල අනුමැතිය තවදුරටත් ලබා දී නොමැති බව	ඉදිරි වර්ෂය සඳහා චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කරවාගෙන පිටපත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඊ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 මාර්ගෝපදේශය	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 විසින් රජයේ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e-GP) ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉදිරියේදී විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව	ඉදිරි වර්ෂයේ සිට රජයේ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e-GP) අනුගමනය කල යුතුය.
(උ)	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2021/05 දරන හා 2021 ජූලි 20 දිනැති චක්‍රලේඛයේ 02 වගන්තිය හා 2008/4(1) දරන චක්‍රලේඛය	සුනාමි නිවාස 15 ක් ප්‍රතිලාභීන් නොවන පාර්ශව විසින් බුක්ති විඳිනු ලැබුවත් ඊට එරෙහිව නීති රීති ප්‍රකාරව කටයුතු කිරීමට වගකිව යුතු නිලධාරීන් අසමත් වී තිබුණි.	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021/05 දරන චක්‍රලේඛය මගින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් අයිතිය ලබා දීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව	වගකීම් පැහැර හැරි නිලධාරීන් සම්බන්ධව සුදුසු විනයානුකූල පියවර ගැනීමටත්, අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමත් කළ යුතුය.
(ඌ)	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 03/2022 දරන හා 2022 ජුනි 10 දිනැති චක්‍රලේඛය 03 (ඇ) ඡේදය හා 07 ඡේදය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් විසින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී යථෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, වැඩිපුර ගෙවා තිබූ විශ්‍රාම වැටුපෙන් රු.9,415,350 ක් 2024 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණි.	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රමිකව එම මුදල් අයකරමින් පවතින බව.	විධිමත් පරීක්ෂණ පවත්වා අවභාවිතයක් සිදු වී ඇත්නම් අදාළ නිලධාරීන්ට විධිමත් පියවර ගැනීමටත්, අනෙකුත් වැඩිපුර ගෙවීම් කඩිනමින් අයකර ගැනීමටත්, විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමටත් කටයුතු කළ යුතුය.

3.5 තැන්පතු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 2 කට වඩා පැරණි තැන්පතු ශේෂ 37 ක එකතුව රු.5,870,922 ක්වූ අතර, ඒ අතරින් එකතුව රු.3,460,374 ක් වටිනා ශේෂ 14 ක් වසර 5 කටත් වඩා පැරණි ඒවා විය. මේ සම්බන්ධව මුදල් රෙගුලාසි 571 අනුව අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.	විගණන නිරීක්ෂණය පිළිගෙන ඇත.	කල් ඉකුත් වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතුය.

3.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත්, අවස්ථා 18 දී නිලධාරීන්ට නිකුත් කර තිබුණු එකතුව රු. 440,972 ක්වූ අතුරු අග්‍රිම පියවීමට දින 13 ත් දින 269 ත් අතර කාලයක් ප්‍රමාද වී තිබුණි.	ඉදිරියේදී මේ පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වමින් අතුරු අග්‍රිම පියවීම සිදුකරගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව.	නියමිත පරිදි අත්තිකාරම් නොපියවීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට විධිමත් පියවර ගැනීමටත්, ඉදිරියේදී මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව නියමිත දින ගණන තුළ අතුරු අග්‍රිම පියවන බව තහවුරු වන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමත් කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කඳුකර දශකය 2024-2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 08 ක ප්‍රතිලාභීන් 51 කට කුරුඳු පැළ 42,440 ක් ලබා දී තිබුණු අතර ඉන් ප්‍රතිලාභීන් 23 දෙනෙකුට ලබාදුන් කුරුඳු පැළ 11,435 ක්ෂේත්‍රයේ සිටුවා නොතිබුණු අතර, ඒ වෙනුවෙන් වැයකර තිබුණු රු.285,875 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.	ප්‍රතිලාභීන් සඳහා කුරුඳු පැළ ලබාදෙන ලද අවස්ථාවේ දැඩි සේ වර්ෂාපතනය පතිතවීම නිසා නැවත එම ඉඩම් සකස් කර පැළ සිටුවීමට සිදු වු බැවින් කුරුඳු පැළ සිටුවීම සඳහා ප්‍රමාදයක් සිදු වු බව.	විධිමත් වැඩපිළිවෙලක් සකසා අධීක්ෂණය හා පසු විපරම සිදු කර ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ආ)	කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බටුකිත්තල සිට ගොවිපල දක්වා මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ගයේ අතුරා තිබුණු කැටගල් නියමිත සම්පීඩන ශක්තිය නොමැති බවට මාර්ග සංවර්ධන අධිකාරියේ පරීක්ෂණාගාර තත්ත්ව වාර්තා අනුව නිරීක්ෂණය විය. ඒ අනුව අංක 05 දරන වැඩ විෂයය යටතේ කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු.797,098 ක් අවිධිමත් හා නිශ්කාර්ය වියදම් වී තිබුණු බවත් නිරීක්ෂණය විය.	විගණනය සිදුකරන අවස්ථාවේ දී මෙම මාර්ගයේ කුට්ටිගල් 03 ක් පරීක්ෂාව සඳහා යොමු කර ඇත. එලෙස ගලවා ගන්නා ලද කුට්ටිගල් අවපැහැ ගැන්වී තිබූ ඒවා වන අතර, එම ගල් වලින් 02ක් 25KN ට වඩා අඩු වී ඇත. එවැනි දුර්වල ගල් ඉවත් කර ඒ සඳහා සුදුසු ගල් යොදා නැවත මාර්ගය කොන්ත්‍රාත්කරු ලවා සකස් කිරීමට කටයුතු කරන බව.	දුර්වල ගල් ඉවත් කර ඒ සඳහා සුදුසු ගල් යොදා නැවත මාර්ගය කොන්ත්‍රාත්කරු ලවා සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීම සඳහා ක්‍රියාමාර්ග හඳුන්වා දිය යුතුය.

(ඇ)	කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිශ්ශංකපුර ප්‍රධාන මාර්ගයේ අබලන්ව තිබූ කොටස සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය යටතේ නිමකර තිබුණු මාර්ගයේ සම්පූර්ණ දුර දිග මීටර් 137න් මීටර් 78 ක එනම් මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණයෙන් සියයට 57 ක් නියමිත ප්‍රමිතියෙන් තොර බවට නිරීක්ෂණය වූ අතර, ඒ සම්බන්ධයෙන් ස්වාධීන තාක්ෂණික ක්ෂේත්‍ර පරික්ෂාවන් හා රසායනාගාර තත්ත්ව පරික්ෂා සිදුකර, ඒ පිළිබද වාර්තා හා සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු අනුව ඉහත ව්‍යාපෘතිය නිවැරදි කිරිම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරිම සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු සමඟ දුරකතනයෙන් සාකච්ඡා කල අතර ඒ පිළිබඳ ස්ථානීය පරික්ෂාවක් සිදු කර අවශ්‍ය ඉදිරි කටයුතු ඉදිරියේදි සිදු කරන බව.	අදාළ නිවැරදි කිරිම කඩිනමින් සිදු කිරීමටත්, විධිමත් පරීක්ෂණයක් පවත්වා අක්‍රමිකතාවයක් සිදු වී ඇත්නම් වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.
(ඈ)	කඳුකර දශකය වැඩසටහන යටතේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.1,310,513ක් වැය කර ගේබියන් පැති බැම්මක් ඉදිකිරීමේදී පැතිබැම්මට නියමිත ප්‍රමාණයෙන් යුතු ගල් යොදා නොමැතිවීම මත ගේබියන් පෙට්ටි ඇතුළත හිස් අවකාශ නිර්මාණය වී ගේබියන් පෙට්ටි ඉදිරියට නෙරා ඇති බවත් ඒ හේතුවෙන් බැම්මේ ශක්තිමත්භාවය අඩු වී ඇති බවත් නිරික්ෂණය විය. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ඒ) අනුකූල නොවී අවිධිමත් ලෙස කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි.	මේ පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් සිදු කිරිම සඳහා ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර එම පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා පැති බැම්මේ ප්‍රමිතිය, ශක්තිමත්භාවය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමටත්, ඒ මත නිර්මිතය හා අදාළ පාර්ශව සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමත් කළ යුතු අතර, උපකොන්ත්‍රාත් ලබා දීම සම්බන්ධයෙන් අදාළ පරිදි කටයුතු කළ යුතුය.

4.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබුණු එකතුව රු.2,775,000 ක්වූ ප්‍රතිපාදන මත වැඩ ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 12 ක් අතරමඟ අතහැර දමා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට වැයකර තිබුණු මුදලේ එකතුව රු.1,663,014 ක් විය.	කඳුකර දශකය වැඩසටහන හා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ප්‍රතිපාදන ලැබුණද මෙම ව්‍යාපෘති 12 ක් නිම කිරීමට නොහැකි වී ඇති බව.	ව්‍යාපෘති අත්හැර දැමීමට අදාළ විධිමත් පරීක්ෂාවක් සිදු කිරීමටත්, අතහැර දමන ලද ව්‍යාපෘති සුදුසු වෙනත් කටයුත්තකට යොදා ගැනීමට ඇති ශක්‍යතාවයන් කඩිනමින් අධ්‍යයනය කොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.

4.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් සඳහා කඳුකර දශකය වැඩසටහන හා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති 73 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එකතුව රු.33,751,479 ක්වූ ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 වනවිටත් අදාළ ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මකකර නොතිබුණු බැවින් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් ළඟාකර ගත හැකි මහජන සුබසාධනයන් අහිමි කර තිබුණි.	එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැන නැගුණු විවිධ ගැටළු හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව.	ව්‍යාපෘතියක සෑම අදියරකදීම ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

4.5 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාතර, තිහගොඩ හා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ටයර්, බල්බ, මුද්‍රණ යන්ත්‍ර හා ටෝනර් මිලදී ගැනීමේදී පිරිවිතරයන්ට අනුකූලව අවම මිලගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන් ප්‍රතික්ෂේප කර මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් පසුව ඇති කරගත් විවිධ උපකල්පන මත පදනම්ව වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන්ගෙන් අදාළ භාණ්ඩ මිලදී ගැනීමේදී එකතුව රු. 362,688 ක් වැඩිපුර ගෙවා තිබුණි.	ඉදිරියේ දී මෙම ඇගයීම් ක්‍රියාවලිය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු අතර, විධිමත් පරීක්ෂණයක් පවත්වා වැඩිපුර ගෙවීම වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	දශවිධ කඳුකර දශකය 2024 – 2033“ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පෙර පාසල් හා පාසල් සඳහා ස්මාර්ට් ටී.වී, වානේ කබඩ් හා අල්මාරි මිලදී ගැනීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 2.6 වගන්තියට අනුකූල නොවී සහ සාරානුකූල ප්‍රතිචාර දක්වා තිබුණු	වෙළඳපල තුල ඉහල පිලිගැනීමක් හා විශ්වාසවන්ත වෙළඳ නාමයක් දිනා ඇති ඉහල ගුණත්වයෙන් යුතු කල් පැවැත්ම, ශක්තිමත් බව හා භාවිතය පහසුව, ප්‍රමිතියෙන් උසස් වීම මළ නොබැඳීම, උසස් නිමාව වැනි හේතු පදනම් කරගෙන අදාළ භාණ්ඩ මිළදී ගෙන ඇති බව	- එම -

	සැපයුම්කරුවන්ගේ මිල ගණන් ප්‍රතික්ෂේප කර පසුව ඇති කරගත් විවිධ උපකල්පන මත පදනම්ව වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන්ගෙන් අදාළ භාණ්ඩ මිලදී ගැනීමේදී එකතුව රු.570,967 ක් වැඩිපුර ගෙවා රජයට පාඩු කර තිබුණි.		

4.6 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින ත්‍රිරෝද රථය 2022 සැප්තැම්බර් 27 දින සිට භාවිතයෙන් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ගර්හිතව පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	මෙම රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් ලෙස බැහැර කිරීම සඳහා කටයුතු කළ යුතුය.
(ආ)	පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2022 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණයේදී අළුත්වැඩියා කළයුතු ලෙස හඳුනාගෙන තිබූ රු. 292,650 ක් පිරිවැය වූ ඡායා පිටපත් යන්ත්‍ර 02ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද, එක් යන්ත්‍රයක වාර්ෂික සේවා ගිවිසුම් අළුත් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.28,910 ක් ගෙවා තිබුණි.	වාර්ෂික සේවා ගිවිසුම් අනුව රු. 28,910/- ක් ගෙවන ලද KYOCERRA යන්ත්‍රය මානව සම්පත් අංශය වෙත ලබා දී ඇති බව හා CANON යන්ත්‍රය අලුත්වැඩියාවට වඩා නව යන්ත්‍රය ක් මිලදී ගැනීම ආයතනයට වඩාත් ලාභදායී බැවින් මෙම යන්ත්‍රය 2025 භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් කර ඉදිරියේ දී අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	මෙම යන්ත්‍ර අලුත්වැඩියා කර භාවිතයට ගැනීම ඵලදායි නම් ඒ සඳහා කටයුතු කළ යුතු අතර, නිශ්කාර්ය ලෙස නඩත්තු වියදම් නොදැරිය යුතුය.
(ඇ)	2021 ඔක්තෝබර් 11 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රාදේශීය ලේකම්තුමිය පදිංචිය සඳහා යොදා නොගෙන තිබූ කොටපොල ප්‍රාදේශීය ලේකම් නිල නිවස 2024 වර්ෂයේ දී රු.541,495 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉතා ආසන්නව පහසුවෙන් ප්‍රවේශවිය හැකි ස්ථානයක ප්‍රාදේශීය ලේකම් පදිංචිව සිටි බැවින් පූර්ණ කාලීනව නිල නිවසේ පදිංචි වී නොසිටි බව, ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කල බැවින් නැවත අලුත්වැඩියාවකින් තොරව වර්තමානයේ එම නිල නිවස භාවිතා කරන බව.	රජයේ දේපල විචක්ෂණශීලිව උපයෝජනය කළ යුතු අතර, අවශ්‍ය නිසි නඩත්තු කටයුතු සිදුකළ යුතු වේ.

4.7 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක 2024 වර්ෂයේදී සිදු වී තිබුණු රු.165,346 ක් වූ හානි හා පාඩු 02ක් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම 01 යටතේ තවදුරටත් ක්‍රියාකිරිමට ඇති හානි හා පාඩු යටතේ දක්වා නොතිබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක සිදු වී තිබුණු රථවාහන අනතුරු 03ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් තක්සේරු කර අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකට අදාලව රු.165,346/- ක් වූ හානි පාඩු සිද්ධි දෙක මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේදී වාර්තා නොවුනු බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් වී නොමැති බවත්, වාහනවලට අදාලව අලාභ ජාතික රක්ෂණභාර අරමුදලෙන් ප්‍රතිපූර්ණය කර ඇති බවත්, මු.රෙ. 104(4) අවසන් වාර්තාව සකස් කිරීමට කමිටුවක් පත් කල බව.	වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, මූල්‍ය ප්‍රකාශනවල නිසි පරිදි වාර්තා කළ යුතුය.
(ආ)	මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ෆුට් වැල් සහිත වතුර මෝටරයක් අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) පරීක්ෂණ පවත්වා 2023 දෙසැම්බර් 04 දින විමර්ශනයක් ද පවත්වා තිබුණු නමුත් මුදල් රෙගුලාසි 104(4) ට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම අස්ථානගතවී ඇති වතුර මෝටරයට අදාලව අවසන් වාර්තාව සකස් කර පොත්වලින් කපා හැරීමට මේ වන විට ගිණුම් අංශයට ලැබී ඇති බව.	කඩිනමින් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, ඉදිරියේදී මෙවැනි අවස්ථා වළක්වා ගැනීමට වත්කම්වල ආරක්ෂාව සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.

4.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

	විගණන විමසුම පිළිබඳ විස්තරය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 50 කට 2025 මැයි 27 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ ගනුදෙනුවල වටිනාකම රු.64,197,761ක් විය.	විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන විගණන විමසුම් සඳහා නිශ්චිත කාලසීමාවක් තුලදී පිළිතුරු සැපයිය යුතු බව පිළිගන්නා බව.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට පිළිතුරු සැපයිය යුතුය. මේ පිළිබඳ ගණන්දීමේ නිලධාරී විසින් විධිමත් වැඩපිළිවෙලක් සකස් කොට විගණනයට වාර්තා කළ යුතු අතර, පෞද්ගලිකව මෙම කාර්යය අධීක්ෂණය කළ යුතුය.

4.9 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාතර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉදිකර තිබුණු සුනාමි සංකීර්ණ නිවාස 10 හි වසර 20 ක සිට පදිංචිව සිටින නිවාසලාභීන් 56 ක් වෙත දීමනාපත්‍ර සකස් කර නිවාස පැවරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	සුනාමි නිවාස - මෙම නිවාස 56 අතරින් 22 ක් සහාධිපත්‍ය වේ. අනෙක් නිවාස සඳහා දීමනා පත්‍ර සකස් කිරිම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇත. අදාල ආයතන සමග සාකච්ඡා කර නිවාස 56 සඳහාම ඔප්පු සකස් කිරීමේ කටයුතු සිදු කරන බව.	කාර්ය නිම කිරීම ප්‍රමාදවීමට අදාළ පාර්ශව වෙත විධිමත් පියවර ගැනීමටත්, කඩිනමින් ඔප්පු සකස් කර ප්‍රතිලාභීන්ට බෙදාහැරීමටත්, මෙය නිශ්චිත ක්‍රියාකාරී සැලැස්මකට ඇතුළත් කිරීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	මුලටියන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වසම් 04 කට අයත් පර්චස් 75 ක් වූ රජයේ ඉඩම් කැබලි 04 ක දූරකථන සමාගම් 04 ක් විසින් දූරකථන සම්ප්‍රේෂණ කුළුණු 04 ක් ඉදිකර ඉඩම් බුක්ති විඳිමින් සිටින අතර, අදාළ ඉඩම් දීර්ඝකාලීන බදු පදනමට ලබාදීම සඳහා කටයුතු ආරම්භ කර වසර 14 ත් 20 ත් අතර කාලයක් දක්වා ප්‍රමාද වී තිබුණි. එසේම වසර 01 ත් 04 ත් අතර කාලයක සිට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී නොතිබුණු දීර්ඝ කාලීන බදු ලිපිගොනු 10 ක් පැවතුණු බැවින් රජයට උපයා ගැනීමට හැකිව තිබුණු බදුකුලී ආදායම් අහිමි කර තිබුණි.	විගණනය විසින් පෙන්වාදී ඇති පරිදි ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී නොතිබුණු දීර්ඝ කාලීන බදු ලිපිගොනු 10 හි අනුමැතිය ලද පසු දීර්ඝකාලීන බදු අයකරන ගැනීමට කටයුතු කරන බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, අදාළ අනුමැතීන් කඩිනමින් ලබාගෙන දීර්ඝ කාලීන බදුකර සකස් කර බදුකුලී අයකිරීමට කඩිනම් වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.
(ඇ)	නායයෑම් පිළිබඳ අධි අවදානම මත 2019 වර්ෂයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් දැනුම් දී තිබූ පරිදි, පදිංචි ස්ථානයෙන් ඉවත් කර වෙනත් සුදුසු ස්ථානයක පදිංචි කිරීම සඳහා ප්‍රතිලාභීන් 03කට ලබාදීමට රජයේ ඉඩම් නිසිපරිදි මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා නොගැනීම හේතුවෙන් ප්‍රතිලාභීන් අවධානම් සහිත නිවසේම තවදුරටත් පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.	නායයෑම් පිළිබඳ අධි අවදානම මත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් දැනුම් දී ඇති පරිදි පදිංචි ස්ථානයෙන් ඉවත් කර වෙනත් සුදුසු ස්ථානයක පදිංචි කිරීම සඳහා ප්‍රතිලාභීන් 03 කට ලබා දීමට රජයේ ඉඩම් නිසි පරිදි මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මේ වන විට පවරා ගෙන ඇති බව.	නැවත පදිංචි කිරීම ප්‍රමාද වීමට වගකිවයුතු පාර්ශව හඳුනාගෙන විධිමත් පරිදි කටයුතු කිරීමටත්, නායයෑම් පිළිබඳ අධි අවදානම මත පදිංචිකරුවන් එම ස්ථානයෙන් ඉවත් කර වෙනත් සුදුසු ස්ථානයක පදිංචි කිරීමට කඩිනමින් කටයුතු කිරීමත් කළ යුතුය.

(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක පවිත්‍රතා සේවා පවත්වාගෙන යාමේදී පවිත්‍රතා උපකරණ හා රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.26,660,379 ක් ගෙවා තිබුණ ද අදාළ උපකරණ හෝ රසායනික ද්‍රව්‍ය කාර්යාල ගබඩාවට ලැබී නොතිබුණු අතර ඒවා පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනයක ඇතුළත් කිරීමෙන් තොරව පවිත්‍රතා සේවකයින් විසින් භාවිතා කරන බව නිරීක්ෂණය වූයෙන් පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ලැබීම් නිකුත් කිරීම් සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	එම අවුරුද්දේ අවශ්‍යතාවය එයින් පියවා ගැනීමට හැකි බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ඇත.	පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ලැබීම් නිකුත් කිරීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා යෝග්‍ය අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසන් වනවිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක හා තෘතියික මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු 15 ක් පැවතුණි.	කාර්ය මණ්ඩල තොරතුරු වාර්තාව සෑම කාර්තුවක් අවසානයේ ඊළඟ මාසයේ අවසාන දිනට පෙර cadreinformation@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන අතර දෛය පිටපත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යොමු කරන බව, පවතින පුරප්පාඩු සඳහා ලිපි නිකුත් කර ඇති බව.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර සේවා අවශ්‍යතාවය මත පුරප්පාඩු පිරවීමට ක්‍රියාකළ යුතුය.
(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද්විතියික මට්ටමේ තනතුරු 326 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 08 ක නිලධාරීන් 334 ක අතිරික්තයක් පැවතුණි.	දැනට සිටින සංවර්ධන නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලයට එකතු කරන බව, ඉදිරියේදී අමාත්‍යාංශ උපදෙස් පරිදි අවශ්‍ය කටයුතු කරන බව	අතිරික්ත නිලධාරීන් වෙනත් සේවා ස්ථානවලට අනුයුක්ත හෝ ස්ථාන මාරු කිරීමෙන් එම අතිරික්ත නිලධාරීන් සුදුසු පරිදි තුලනය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.
(ඇ)	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02/2018 හා 2018 දරන හා ජනවාරි 24 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් එම සැලැස්ම සකස් කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්ම සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව අදාළ සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, එහි පිටපතක් විගණකාධිපති වෙත ද ඉදිරිපත් කළ යුතුය.

(ඉ)	2019 ජූලි 04 දින කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් වැවිලි ප්‍රජා සන්නිවේදන සලසන්නා ලෙස පත් කළ නිලධාරියෙක් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. 2024 වන විටත්, එම නිලධාරියාට සඳහා රාජකාරි ලැයිස්තුවක් ලබා දී නොතිබුණ අතර. ඔහුගේ රාජකාරි පිළිබඳ නිසි අධීක්ෂණයක් නොකර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඔහුට එකතුව රු.2,589,884 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.	මෙම නිලධාරියා අමතා ක්ෂේත්‍ර සටහන් පොතක් පවත්වා ගත යුතු බව රාජකාරි ලැයිස්තුව අනුව කටයුතු කළ යුතු බවත් ඉදිරිවැඩසටහන් සකස් කර නියමිත දිනට අධික්ෂණ නිලධාරිට ලබාදිය යුතු බවටත් උපදෙස් ලබා දෙන ලදි.	අදාළ නිලධාරියා හට රාජකාරි නොපැවරීම සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරීන්ට එරෙහිව විධිමත් පරිදි කටයුතු කිරීමටත්, සියලු නිලධාරීන් සම්බන්ධව විධිමත් පරිදි රාජකාරි පැවරීමක් සිදු කර නිසි අධික්ෂණය සිදු වන බව තහවුරු වන වැඩපිළිවෙලක් සැකසිය යුතුය.
(ඊ)	මධ්‍යම රජයට අයත් කාර්මික නිලධාරීන් සහ තාක්ෂණික සහකාර නිලධාරීන් නිසි පරිදි අනුයුක්ත කර නොමැතිවීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කර්යාල 07 ක පුරප්පාඩු 11 ක් හා තවත් කාර්යාල 02 ක අතිරික්ත නිලධාරීන් 03 ක් පවතින බව නිරීක්ෂණය විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර පුරප්පාඩු හා අතිරික්තතා තුලනය කර නොතිබුණු බැවින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී කාර්මික නිලධාරීන්ගේ දායකත්වය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සමානව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	ඉදිරියේදී කඩිනමින් සියළුම කාර්යාල වලට තුලනය වන පරිදි ස්ථාන මාරුවීම් (මධ්‍යම රජය යටතේ) සිදු කිරීමට කඩිනමින් කටයුතු කරන බව	කාර්මික නිලධාරීන් නිසි තුලනයකින් යුතුව සේවා නියුක්ත කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.